පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - විද්‍යාව (කාලය: පැය 2 යි)

සතිය - මාර්තු 3 වන සතිය

9 ශ්‍රේණිය

සැකසුම - යූ.බී.සී.එස්. ප්‍රේමරත්න
ර/නිවි/ කොඩිපිලිකන්ද විද්‍යාලය

School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

මාතෘකාව : 4 - බලය හා සම්බන්ධ මූලික සංකල්ප

මෙම පාඩම අධ්‍යයනයෙන් පසුව :

- බලය මැනීමේ සම්මත ඒකකය N (නිව්ටන් )බව ප්‍රකාශ කරයි.
- බලයට විශාලත්වයක්,දිශාවක් හා උපයෝගී ලක්ෂයක් ඇති බව පෙන්වීම සඳහා සරල ක්‍රියාකාරකම් සිදු කරයි.
- බලය දෛශික රාශියක් බව ප්‍රකාශ කරයි.
- එදිනෙදා ජීවිතයේදී වැඩ පහසු කරගැනීමට බලයේ උපයෝගී ලක්ෂ්‍යය හා දිශාව උචිත ආකාරයට වෙනස් කළ හැකි බව පිළිගනී.

**පෙළ පොතේ පිටු අංක 52 හොඳින් කියවන්න. දැන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. බලයක් යනු කුමක්ද?
2. බලයක් යෙදීම මගින් කල හැකි දේවල් මොනවාද?

**පෙළ පොතේ පිටු අංක 53 හොඳින් කියවන්න.දැන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. බලයක විශාලත්වය මැනීමට යොදා ගන්නා උපකරණය කුමක්ද?
2. බලයේ විශාලත්වය මැනීමට යොදාගන්නා අන්තර්ජාතික (SI) ඒකකය කුමක්ද?
3. සාමාන්‍ය භාවිතයේ දී යොදා ගන්නා දුනු තරාදි ක්‍රමාංකනය කර ඇති ඒකක මොනවාද?

**පෙළ පොතේ පිටු අංක 55,56 ඇති ක්‍රියාකාරකම් 4 .2 හා 4.3 නිවසේදී සිදු කරන්න.**
**පිටු අංක 54 ,55, 56 හොඳින් කියවන්න.ඒ අනුව පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. බලයේ උපයෝගී ලක්ෂ්‍යය යනු කුමක්ද?
2. බලයට දිශාවක් පවතීද?
3. විශාලත්වයක් මෙන්ම දිශාවක් ඇති රාශි හඳුන්වන නම කුමක්ද?
4. ඒ අනුව බලය කවර රාශියක් ද?

**පෙළ පොතේ පිටු අංක 56 ,57 හොඳින් කියවන්න. දැන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

1. බලයේ විශාලත්වය ……… මගින් ද බලයේ දිශාව … මගින් ද උපයෝගී ලක්ෂ්‍යය ............ මගින් නිරූපණය කළ හැකිය. (ඊ හිස, සරල රේඛා ඛණ්ඩයේ දිග, සරල රේඛාව මත ඇති තිත්)
2. ලී කුට්ටියක් මත බටහිර දිශාවට ක්‍රියාකරන 5N බලයක් රූපිකව නිරූපණය කරන්න. (1N= 1cm ලෙස ගන්න.)

**දැන් ඔබ මෙම පාඩම සාර්ථකව අධ්‍යයනය කර ඇත. පිටු අංක 58,59හි ඇති අභ්‍යාස වලට පිළිතුරු ලියන්න.**
**වැඩිදුර අධ්‍යයනය සඳහා හැකිනම් :**
**https://www.youtube.com/watch?v=mRX1aSa7it0&list=PLbxSmkLpnFenwYPbamwpLeeFk1moZKayS&index=10**